<u>ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල</u>

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

1.2.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩාගාර බිල්පත් පොලි ආදායම රු. 11,698,075 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල රු. 11,665,471 ලෙස දැක්වීම හේතුවෙන් එම පොලී ආදායම රු. 32,604 කින් අඩුවෙන් දැක්වුණු අතර ඒ හා සමාන ප්‍රමාණයෙන් අතිරික්තයද අඩුවෙන් දැක්වුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල කෙටි කාලීන භාණ්ඩාගාර බිල්පත් පොලී ආදායම රු.2,191,160 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එය රු. 2,258,640 ක් ලෙස දැක්වීම හේතුවෙන් එම පොලී ආදායම රු. 67,480 කින් වැඩියෙන් දැක්වුණු අතර ඒ හා සමාන ප්‍රමාණයෙන් අතිරික්තයද වැඩියෙන් දැක්වුණි.

(ඇ) අරමුදල මගින් ජෛව වෛද්‍ය ඉංජිනේරු අංශය වෙත ජාතික රෝහලට උපකරණ ලබාදීම සඳහා ලබාදුන් රු.103,571 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රතිපූර්ණය කර නොතිබුණු අතර එම මුදල අරමුදලෙහි වියදමක් ලෙස දැක්වීම නිසා වර්ෂයේ අතිරික්තය ඒ හා සමාන ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. එසේම ජංගම වත්කම්ද ඒ හා සමාන ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී ළදරු හා ළමා පෝෂණය පිළිබඳ (IYCP) සෞඛ්‍ය ක්ෂේත්‍ර නිලධාරීන් පුහුණු කිරීමේ වැඩ සටහන සඳහා රු. 300,000 ක අත්තිකාරමක් ලබාදී තිබුණු අතර ඉන් සමාලෝචිත වර්ෂයට අදාල වියදම රු. 169,762 ක් පමණක් වුවද මුළු අත්තිකාරම් මුදලම වියදම ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය රු. 130,238 ක් අඩුවෙන් දැක්වුණි. එසේම ඒ හා සමාන ප්‍රමාණයෙන් ජංගම වත්කම්ද අඩුවෙන් දැක්වුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ අතිරික්තය ලෙස රු. 79,363,105 ක අගයක් දක්වා තිබුණද ඊට ඉකුත් වර්ෂයේ ගැලපීමක් වූ රු. 6,157,268 ක අගයක්ද ඇතුලත්ව තිබුණි. මේ හේතුවෙන් වර්ෂයේ අතිරික්තය සමාන අගයෙන් වැඩියෙන් දැක්වුණු අතර, ඉකුත් වර්ෂය සඳහා වූ ගැලපීම් සමුච්චිත අරමුදලට ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) අරමුදලෙහි වෙබ්අඩවි අරමුදල නමින් රු. 94,120 ක වියදමක් දරා තිබුණු අතර අදාල වියදම සෞඛ්‍ය සංවර්ධන ව්‍යාපෘති වියදම් යටතේ දක්වා නොතිබුණි.

(උ) ඉහල බෙලිගල්ල ග්‍රාමීය රෝහල සංවර්ධනය කිරීම සඳහා වූ වාර්ෂික වියදම රු. 17,135,144 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද එහි වාර්ෂික වියදම රු. 16,710,639 ක් වූයෙන් රු.424,504 කින් වියදම වැඩියෙන් දක්වා තිබුණි. ඒ අනුව ඒ හා සමාන ප්‍රමාණයෙන් අතිරික්තය අඩුවෙන් දැක්වුණි.

1.2.2 <u>පැහැදිලි නොකල වෙනස්කම්</u>

2011 වර්ෂය තුළ පොදු අරමුදලට කළ හර කිරීම් සහ බැර කිරීම් සම්බන්ධයෙන් ඉදිරිපත් කළ විස්තර අනුව අරමුදලෙහි වැඩිවීම රු. 6,526,001 ක් විය යුතු වුවද, ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශනය ප්‍රකාරව එය රු.19,919,082 ක අඩුවීමක් විය.

1.2.3 <u>ලැබිය යුතු ගිණුම්</u>

ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක ඉදි කිරීම් නියමිත පරිදි අවසන් නොකිරීම හේතුවෙන් අවලංගු කරනු ලැබූ කොන්ත්‍රාත්තුවකට අදාලව සෙලින්කෝ රක්ෂණ සමාගමෙන් ලැබිය යුතු කාර්ය සාධන සුරක්ෂණ ඇපකරයක වටිනාකම වූ රු. 1,372,346 ක් වර්ෂ 4 ක කාලයක සිට දිගින් දිගටම පැවතෙන අතර එය අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදීද පියවර ගෙන නොතිබුණි.

1.2.4 <u>නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අරමුදලෙහි වාර්ෂික අයවැය ලේඛනය ඊට පෙර වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට පෙර භාණ්ඩාගාරයට ඉදිරිපත් කල යුතු වුවද, අයවැය ලේඛනය පිළියෙල කර නොතිබුණි.

1.2.5 <u>ප්‍රමාණවත් අධිකාර් බලයකින් තහවුරු නොවූ ගනුදෙනු</u>

ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුවේ නිලධාරීන්ට වැටුප් සහ දීමනා ගෙවීම් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අක්ෂි බැංකුවේ කළමනාකරු හා කණිෂ්ඨ කළමනාකරු යන තනතුරු සඳහා මාසිකව කළමනාකරණ දීමනා ලෙස රු. 15,000 සහ රු. 9,500 බැගින් සමාලෝචිත වර්ෂයේදී දීමනා ගෙවා තිබුණු අතර ඒ සඳහා ලබාගත් විධිමත් අනුමැතියක් නොවුණි.

(ආ) කාර්යාලීය කටයුතුවල සේවයේ නිරතවන අක්ෂි බැංකුවේ කණිෂ්ඨ කළමනාකරු හා කළමනාකරණ සහායක වෙත වාර්ෂිකව රු. 12,000 බැගින් අනුමැතියක් රහිතව නිල ඇඳුම් දීමනා ගෙවා තිබුණි.

(ඇ) ඇස් රෝහලින් අනුයුක්ත කල නිලධාරීන් සඳහා ඔවුන්ගේ මාසික වැටුපත් සමඟ වාර්ෂික නිල ඇඳුම් දීමනාවද ගෙවා තිබූ නමුත් ජාතික අක්ෂි බැංකුවෙන්ද එම නිලධාරීන් වාර්ෂික නිල ඇඳුම් දීමනා ලබා ගෙන තිබුණි. ඒ අනුව නිලධාරීන් 4 දෙනෙක් සඳහා අක්ෂි බැංකුවෙන් රු.20,000 ක් ද ඇස් රෝහලින් වැටුපත් සමඟ රු.36,000 ක් ද නිල ඇඳුම් දීමනා ගෙවා තිබුණි.

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුල අරමුදලේ මෙහෙයුම් වලින් වූ අතිරික්තය රු.79,363,106 ක් වූ අතර ඊට ප්‍රතිරූපකව ඉකුත් වර්ෂය සඳහා වූ ඌනතාවය රු. 108,583,244 ක් වූයෙන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.187,946,350 ක වර්ධනයක් දක්නට ලැබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) ඉකුත් වර්ෂය හා සසඳන විට ලොතරැයි ආදායම හා පෞද්ගලික ප්‍රදාන පිළිවෙලින් රු.5,112,220 ක් හා රු.94,896,935 කින් වැඩි වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂය හා සසඳන විට සෞඛ්‍ය සංවර්ධන ව්‍යාපෘත වියදම් රු. 83,718,091 කින් අඩු වී තිබුණි.

(ඇ) ආදායම් වැඩි වීම හා ඊට අනුරූපව වියදම්ද අඩු වීම මූල්‍ය ප්‍රතිපලයේ වැඩිවීමට බලපා තිබුණි.

## 3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

### 3.1 <u>කාර්ය සාධනය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) වකුගඩු රෝගීන් සම්බන්ධයෙන් සායන පැවැත්වීමේ වැඩ සටහනට අදාලව වන මූල්‍ය හා භෞතික කාර්ය සාධනය පහත දැක්වේ.

| | භෞතික කාර්ය සාධනය | | | මූල්‍ය කාර්ය සාධනය | | |
|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත සංඛ්‍යාව | තථ්‍ය | % | ඇස්තමේන්තුගත සංඛ්‍යාව | තථ්‍ය | % |
| | ---------- | -------- | | --------- | ------ | |
| | | | | රු. | රු. | |
| වකුගඩු රෝගීන් සඳහා සායන පැවැත්වීම | 130 | 72 | 55.3 | 1,900,000 | 839,861 | 44.2 |

කාර්ය සාධනය සම්බන්ධයෙන් වූ නිරීක්ෂණ පහත දැක්වේ.

i. අපේක්ෂිත වාර්ෂික රෝගීන් සංඛ්‍යාවන් දක්වා තිබුණු නමුදු මාසිකව ඉදිරිපත් කරන ලද කාර්ය සාධන වාර්තාවන්හි පරීක්ෂාවට භාජනය කරනු ලැබූ රෝගීන් සංඛ්‍යාවන් දක්වා නොතිබුණෙන් රෝගී සහභාගිත්වය පිළිබඳ භෞතික කාර්ය සාධනය ඇගයීමට ලක් කල නොහැකි විය.

ii. දෙනු ලැබූ අරමුදල් අදාල අරමුණ කරා යොදවා තිබේද යන්න පිළිබඳ සනාථ කර ගැනීමට ඒ සම්බන්ධයෙන් වූ ප්‍රගති සමාලෝචන වාර්තා නොතිබුණි.

(ආ) අරමුදලෙන් ප්‍රතිපාදිත මුදල් මත ක්‍රියාත්මකව පවතින ශ්‍රී ලංකා අක්ෂි බැංකුව මගින් අක්ෂි පටල 343 ක් එකතු කර තිබුණු අතර පටල 299 ක් රෝගීන්ට බද්ධ කිරීම සඳහා ලබාදී තිබුණ. පටල 9 ක් අපනයනය කර තිබුණි. ඒ අනුව පටල එකතු කිරීමේ මාසික සාමාන්‍ය කාර්ය සාධනය 29 ක් පමණ පහළ අගයක් ගෙන තිබුණි.

(ඇ) විවිධ කාර්යන් 23 ක් සඳහා වර්ෂ 3 සිට වර්ෂ 24 දක්වා කාලපරාසයක් තුළ ලැබී තිබූ රු.25,031,559 ක මුදල 100% ක්ම නිෂ්කාර්යව පැවතුණි. එසේම මුහුද ගොඩගැලීමේ ව්‍යසනය සඳහා ලැබී තිබුණු රු.12,655,353 ක මුදලක් ද වර්ෂ 7 ක කාලයක් තිස්සේ නිෂ්කාර්යව පැවතුණු අතර උපයෝජනය නොවූ ප්‍රතිශතය 82% ක් විය.

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

උතුරු පළාත් ජනතාවගේ පෝෂණ තත්ත්වය පිළිබඳ සමීක්ෂණයක් කිරීම අරමුණු කරගෙන යුනිසෙෆ් ආයතනය විසින් රු. 2,644,568 ක මුදලක් ප්‍රදානය කර තිබුණ අතර ඊට අතිරේකව රු.1,175,872 ක අතිරේක ඇස්තමේන්තුවක්ද අනුමත කර තිබුණි. අතිරේක ඇස්තමේන්තුවෙන් 63% ක් වූ රු. 750,000 ක් වූ මුදලම උපයෝජනය කර තිබුණේ නවාතැන් පහසුකම් වෙනුවෙනි.

3.3 **<u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගංවතුර උවදුරින් පීඩාවට පත් දිස්ත්‍රික්කවල වැසියන්ට සහන සැලසීමේ කටයුතු සඳහා අනුරාධපුර, මඩකලපුව, කලමුණේ යන දිස්ත්‍රික්ක වෙත රු. 200,000 බැගින් අරමුදල් සපයා තිබුණි. මෙහිදී ලෝක සෞඛ්‍ය සංවිධානයට ඉදිරිපත් කළ ක්‍රියාකාරකම් යෝජනාව අනුව සහන සේවකයන්ගේ ආහාර සඳහා වියදම් කල යුතු වූයේ 16.7% ක් වුවද ඉහත දිස්ත්‍රික්කවල පිළිවෙලින් 92.4% ක්, 86.1% ක් සහ 61.5% බැගින් වැය කර තිබුණි.

(ආ) සහන සේවකයන්ගේ සහභාගිත්වයෙන් ඉටු කරනු ලැබූ කාර්ය භාරය කවරේද සහභාගි වූ පිරිස කවුරුන්ද යන්න සහ ඒ පිළිබඳ වූ කාර්ය සාධන සහ ප්‍රගති වාර්තා යනාදිය නොතිබුණි.

3.4 **<u>ආර්ථික නොවූ ගනුදෙනු</u>**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගංවතුර සහනාධාර ප්‍රගති සමාලෝචන රැස්වීම පැවැත්වීම සඳහා නිලධාරීන් 68 දෙනෙක් සඳහා ආහාර සහ නවාතැන් ගාස්තු ලෙස රු. 531,656 ක මුදලක් හබරණ පිහිටි හෝටලයක් වෙත ගෙවා තිබුණි. ඒ සඳහා නිලධාරීන් 45 දෙනෙක් පමණක් සහභාගි වී තිබුණෙන් නිලධාරීන් 23 දෙනෙක් වෙනුවෙන් ගෙවා තිබුණු නැවතිමේ හා ආහාර ගාස්තු වූ රු. 179,825 ක මුදල නිෂ්කාර්ය වියදමක්ව තිබුණි.

(ආ) ඩෙංගු අවේක්ෂණ ව්‍යාපෘතියෙහි ප්‍රවාහන කටයුතු සඳහා බාහිර ආයතනයකින් මාසික කුලී පදනම මත වෑන් රථයක් ලබා ගැනීම සඳහා එකඟ වී තිබුණු අතර ඒ සඳහා වන මාසික ගාස්තුව අවමය කි.මී. 2500 කට යටත්ව රු. 85,000 ක් විය. එසේ වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස සිට 2012 අපෙල් දක්වා වූ කිසදු මාසයක අවම කිලෝමීටර් ප්‍රමාණය ධාවනය කර නොතිබුණි. තවද මාසික කුලිය අනුව කි.මී. 1 ක සාමාන්‍ය ගාස්තුව රු. 34 ක් වුවද ඉහත මාස 05 තුල ධාවනය කරනු ලැබූ දුර ප්‍රමාණයන් පිළිබඳ පරීක්ෂාවේදී කි.මී. 1 ක් සඳහා රු. 48 සිට 107 දක්වා පරාසයක විහිදී තිබුණි.

3.5 **<u>අරමුදල් උපයෝජනය</u>**

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) බදුල්ල දිස්ත්‍රික්කයේ සනීපාරක්ෂක වැසිකිළි ව්‍යාපෘතිය සඳහා ලබාදුන් අත්තිකාරම් මුදල්වල 2011 වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස රු. 1,377,613 ක් තිබුණු අතර ඒ සඳහා වන මුදල් පියවීම 2011 ජුලි මාසයේදී සිදු කර තිබුණි. එයින් රු. 779,014 ක මුදලක් එනම් 56% ක ප්‍රතිශතයක් උපයෝජනය වී නොතිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේ මාස 7 ක කාලයක්ද ගතවීමෙන් අනතුරුව පියවා තිබුණි. තවද මු.රෙ. 371 (2) ඇ ප්‍රකාරව යම්

කාර්යයක් නිම කල විගසම ලබාගත් අත්තිකාරම් පියවිය යුතු වුවද එසේ සිදු කර නොතිබුණි.

(ආ) ජාතික පෝෂණ මාසය ලෙස ජුනි මාසය නම්කර තිබුණු අතර ඒ වෙනුවෙන් පෝෂණයට අදාළ අත්පොත් 4000 ක් මුද්‍රණය සඳහා රු.340,000 ක මුදලක් ලෝක ආහාර වැඩසටහනෙන් ලැබී තිබුණි. එසේ වුවද මෙම අත්පොත් අගෝස්තු මාසය තුළ ලැබී තිබුණු අතර පෝෂණ මාසය වෙනුවෙන් ඵලදායක අන්දමින් බෙදා හැරී බවට වු තහවුරුවක් විගණණයට නොවුණි.

## 3.6 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) මහරගම රාජ්‍ය බැංකු ශාඛාවක පැවති ජංගම ගිණුම අනුව සමාලෝචිත වර්ෂයේ මාර්තු මාසයේ 01 දින රු.මිලියන 25 ඉක්මවා ශේෂයක් පැවත තිබුණු අතර එම මුදල මාර්තු 31 දින තෙක්ම නිෂ්කාර්යව පැවතීමෙන් අනතුරුව එදින කෙටිකාලීන භාණ්ඩාගාර බිල්පත්හි (Repo) ආයෝජනය කර තිබුණි. මෙලෙසම අප්‍රේල් මාසයේදීද ජුල මාසයේ දීද පිළිවෙලින් දින 15 ක් හා දින 8 ක කාලයක් රු. මිලියන 25 කට අධික මුදලක් නිෂ්කාර්යව පැවතුණි. මේ අනුව මෙකී මුදල් කෙටී කාලීන භාණ්ඩාගාර බිල්පත්හි ආයෝජනය කිරීමෙන් පොළි ආදායම උපයා ගැනීමට තිබූ අවස්ථාව ගිලිහි ගොස් තිබුණි.

(ආ) රාජ්‍ය බැංකවක ජංගම ගිණුමේ වූ රු.2,375,257 ක ශේෂය 2010 අප්‍රේල් මාසයේ සිට නිෂ්කාර්යව පැවත තිබුණු අතර අදාල මුදල් කොටිකාලීන ආයෝජනයක යෙදවීමට පියවර ගෙන නොතිබුණි.

## 4. පද්ධති හා පාලන

පහත සඳහන් ක්ෂේත්‍රයන්හි දක්නට ලැබුණු පද්ධති හා පාලන දුර්වලතා කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුවිය යුතුව ඇත.

(අ) අත්තිකාරම් ලේඛන පැවැත්වීම
(ආ) පුහුණු වැඩ සටහන් සඳහා දීමනා ගෙවීම
(ඇ) එක් එක් ව්‍යාපෘති වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් ගිණුම් පැවැත්වීම

ඇමුණුම 1

ආදායම් හා වියදම් ප්‍රකාශය

-----------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ ආදායම් හා වියදම් ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දක්වා ඇත.

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | | | |
|---|---|---|---|---|
| | 2011 | | 2010 | |
| | රු. | රු. | රු. | රු. |
| ආදායම | | | | |
| සුවසෙත/ජාතික සම්පත ලොතරැයි ආදායම | 39,228,040 | | 34,115,820 | |
| පරිත්‍යාග | 130,926,696 | | 36,029,761 | |
| ආයෝජන පොලී | 14,192,687 | | 18,195,761 | |
| අනෙකුත් ආදායම් | 1,083,848 | | 272,150 | |
| | ----------- | 185,431,271 | ----------- | 88,613,4 |
| වියදම් | | | | |
| පරිපාලන වියදම් | 1,190,256 | | 997,702 | |
| මූල්‍ය හා අනෙකුත් වියදම් | 39,014 | | 758,300 | |
| සෞඛ්‍ය සංවර්ධන ව්‍යාපෘති වියදම් | 110,996,163 | | 194,714,254 | |
| | ------------- | 112,225,433 | -------------- | 196,470,2 |
| | | ------------- | | ---------- |
| | | 73,205,838 | | (107,856,76 |
| පෙර වර්ෂ ගැලපුම් | | 6,157,268 | | (726,48 |
| | | -------------- | | ------------- |
| | | 79,363,106 | | (108,583,24 |
| | | ========= | | ========= |

ඇමුණුම 02

<u>ආයෝජන ප්‍රකාශය</u>

ස්ථාවර තැන්පත්

| සහතිකයේ අංකය | ආයෝජනය කළ දිනය | ආයෝජන කාලය | 2011 ජනවාරි 01 දිනට ශේෂය | 2011 වර්ෂය තුල ආයෝජනය කිරීම් | 2011 වර්ෂය තුල ආපසු ගැනීම් | 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| | | | රු. | රු. | රු. | රු. |
| 329645 | 2011.12.21 | වර්ෂ 1 | - | 23,000,000 | - | 23,009,000 |
| 329646 | 2011.12.21 | මාස 3 | - | 63,000,000 | - | 63,000,000 |
| | | | | 86,000,000 | | 86,000,000 |

භාණ්ඩාගාර බිල්පත්

| සහතිකයේ අංකය | ආයෝජනය කල දිනය | ආයෝජන කාලය | 2011 ජනවාරි 01 දිනට ශේෂය | 2011 වර්ෂය තුල ආයෝජනය කිරීම | 2011 වර්ෂය තුල ආපසු ගැනීම් | 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| ලංකා බැංකුව | | දින | රු. | රු. | රු. | රු. |
| 314 | 2011.09.02 | 364 | 12,056,396 | - | - | 12,129,57 |
| 314 | 2011.10.21 | 182 | 40,310,835 | - | - | 40,291,35 |
| 314 | 2011.03.11 | 364 | 12,306,003 | - | - | 13,434,48 |
| 314 | 2011.11.25 | 91 | 23,705,160 | - | - | 23,673,17 |
| 314 | 2010.10.01 | 182 | 6,290,830 | - | 6,290,830 | |
| 314 | 2011.12.09 | 182 | 4,828,585 | - | - | 4,800,77 |
| 314 | 2011.11.25 | 182 | 7,722,008 | - | - | 7,703,41 |
| 314 | 2011.09.02 | 182 | 6,029,375 | - | - | 6,048,31 |
| MIOB022269 | 2010.12.17 | 19 | 25,000,000 | - | 25,000,000 | |
| MIIB024103 | 2011.12.28 | 6 | - | 14,500,000 | - | 14,500,00 |
| MIIB024104 | 2011.12.28 | 6 | - | 10,000,000 | - | 10,000,00 |
| | | | 138,249,192 | 24,500,000 | 31,290,830 | 132,581,09 |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුව | | | | | | |
| 2010100226 | 2011.10.21 | 91 | 5,306,286 | - | - | 5,679,90 |
| 2010100272 | 2011.01.28 | 91 | 1,000,000 | - | 1,000,000 | |
| 2010060221 | 2011.06.10 | 364 | 16,751,838 | - | - | 18,276,26 |
| 2010100273 | 2011.01.28 | 91 | 5,000,000 | - | 5,000,000 | |
| 2010060157 | 2011.06.10 | 364 | 3,666,360 | - | - | 3,729,60 |
| 2010100064 | 2011.10.07 | 91 | 15,119,555 | - | - | 16,184,12 |
| 201010021 | 2011.10.07 | 91 | 1,967,536 | - | - | 1,965,36 |
| 2010100310 | 2011.04.29 | 04 | 17,644,344 | - | 17,644,344 | |
| | | | | - | | |
| | | | 66,455,919 | | 23,644,344 | 45,835,25 |
| | | | 204,705,111 | 24,500,000 | 54,935,174 | 178,416,34 |